# මොනරාගල ප්‍රාදේශීය සභාව
# 2021.08.24 දින මහ සභා වාර්තාව

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ නිළ කාලය ආරම්භ කිරීමෙන් පසුව පවත්වනු ලැබූ හතලිස් එක්වන (41) සභා වාරය 2021.08.24 වන දින ප.ව 02.30 ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. එහි සංෂිප්ත වාර්තාව පහත සඳහන් කරමි.

**පැමිණීම**

| | | |
|---|---|---|
| 01. ගරු සභාපති | - | ආර්.එම්.රත්නවීර මැතිතුමා |
| 02. ගරු උප සභාපති | - | ආර්.එම්.ප්‍රදීප් විජේරත්න මැතිතුමා |
| 03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | වයි.උපුල් මැතිතුමා |
| 04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩී.සුනිල් අරංගල මැතිතුමා |
| 05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.ක්‍රිශාන්ත රත්නායක මැතිතුමා |
| 06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජී.ඩී.චාමර නානායක්කාර මැතිතුමා |
| 07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එම්.ගුණවර්ධන මැතිතුමා |
| 08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | රංජිත් රත්නායක මැතිතුමා |
| 09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තරංග දිසානායක මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | තමෝදිරම් ජයසීලන් මැතිතුමා |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සන්ධ්‍යා අනුරුද්ධිකා රත්නායක මැතිතුමිය |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.අතුල කුමාරසිරි මැතිතුමා (ප්‍රතිපක්ෂ නායක) |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ප්‍රදීප් ධම්මික විතානගේ මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.රමණී රත්නායක මැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.එම්.උදේනි රම්‍යලතා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.මනෝජා ලක්මිණි මැතිතුමිය |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.සනත් ගුණවර්ධන මැතිතුමා |
| 18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.එම්.පී.බණ්ඩාර මැතිතුමා |
| 19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අජිත් ශාන්ත අගලකඩ මැතිතුමා |
| | | |
| සභා ලේකම් | - | ඩී.එම්.අනුර දිසානායක මහතා |

පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් මාසික මහ සභාව සාර්ථක කර ගැනීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටින සියලු දෙනා පිළි ගනිමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. තව ද කොරෝනා වෛරසය ව්‍යාප්ත වීමත්, සංචරණ සීමා හා ඇඳිරිනීතිය පැනවීම හා තමන්ට කොරෝනා වෛරසය ආසාධනය වී නිරෝධායනය වී සිටීම වැනි කාරණා මත මීට පෙර සියලූම සභිකවරුන්ට දුරකථනයෙන් දැනුම් දී සාකච්ඡා කර ගත් පරිදි අද දිනට මෙම මස සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කළ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

## 01. පසුගිය මස සභා වාර්තාව සභා සම්මත කර ගැනීම.

මේ වන විටත් ඔබතුමන්ලාහට ලබා දී ඇති පසුගිය මාසික මහ සභාවේ සභා වාර්තා කෙටුම්පත කියවූවා සේ සලකා සංශෝධන ඇත්නම් ඒවා පෙන්වා දී සංශෝධන නැත්නම් ගරු සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදි.

එහිදී වයි.උපුල් ගරු මන්ත්‍රීතුමන් විසින් පසු ගිය සභා වාර්ථාවේ “මේ වන විට මුළු රටේමත් බල ප්‍රදේශය තුළත් අවුරුදු 60ට වැඩි සහ 30ට වැඩි සියලූම දෙනාට කොවිඩ් එන්නත් කරණය සිදු කිරීම සඳහාත් එය සාර්ථක කර ගැනීමටත් මූලික කටයුතු සලසා දුන් අති ගරු ජනාධිපතිතුමන්ටත්, දිස්ත්‍රික් නායක ගරු ශෂීන්ද්‍ර රාජපක්ෂ මැතිතුමන්ටත් ගෞරවනීය ස්තූතිය පුද කර සිටින බවට තමන් කරන ලද ප්‍රකාශය ඒ ආකාරයෙන්ම සටහන් වී නොමැති බැවින් එය නිවැරදි විය යුතු බවටත් , එවගේම ප්‍රදේශයේ සියලූම ජනතාවගේ පොදු අවශ්‍යතාවයක් වන සමූපකාර ව්‍යාපාරය සඳහා ඔවුන්ගේ ඉල්ලීම පරිදි සුපර් මාකට් එකේ අලුතින් ඉදිකරන ලද කඩ කාමර 16 න් මේ වන විට කඩ කාමර 15 ක් ලබා දී ඇති අතර එම කඩ කාමර ලබා දෙන ලද පදනමින්ම ඉතිරි කඩ කාමරය මෙම සමූකාරය පවත්වාගෙන යාම සඳහා ඔවුන් හට ලබා දෙන ලෙස” තමන් කළ ප්‍රකාශය ඒ ආකාරයෙන්ම නිවරදි විය යුතු බවටත් ප්‍රකාශ කර සිටින ලදි.

එම සංශෝධන ඊලඟ සභා රැස්වීම් වාර්තාවේදී නිවරදි කර දක්වන ලෙසට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

වෙනත් සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූයෙන් ඉහත සංශෝධනයට යටත්ව පසු ගිය මස මහ සභා වාර්තාව සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමන්ගේ සහ කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කරන ලදි.

## 02. <u>සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන</u>

- 2022 වර්ෂයට සකස් කිරීමට නියමිත ප්‍රාදේශීය සභා අය වැය සඳහා මෙතෙක් යෝජනා ලබා දී නොමැති අය සිටීනම් 2021 අගෝස්තු 31 දිනට පෙර යෝජනා ලබා දෙන ලෙස ගරු සභාපතිතුමන් විසින් මහ සභාවේ අවධානය පිණිස නිවේදනය කර සිටින ලදි.

- ඒ වගේම 2021 වර්ෂය සඳණීහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොමැති සභිකවරුන් වහාම ක්‍රියාත්මක වන පරිදි තම තමන්ට අදාල වත්කම් හා බැරකම් ප්‍රකාශ මෙම මස අවසන් වීමට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් මහ සභාවේ අවධානය පිණිස නිවේදනය කර සිටින ලදි.

## 03.<u>සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම</u>.

**ඉදිරිපත් වී නොමැත**

## 04. <u>යථා පරිදී කල් දී ඇති ප්‍රශ්න සාකච්ඡා කිරීම</u>

**නැත**

## 05. <u>යථා පරිදී කල් දී ඇති යෝජනා සාකච්ඡා කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීම හා සභා තීරණ ගැනීම බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

### <u>ගරු සභාපති ආර්.එම්.රත්නවීර මැතිතුමා විසින්</u>

### <u>සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**යෝජනා අංක 01**

මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර සඳහා යන වියදම සලකා බලා දැනට මෙම පොහොර 01 kg ක විකුණුම් මිළ වන රු.15 ක මුදල රු.20ක් දක්වා ඉහළ දැමීම සඳහාත් තවද එක් ගොවියෙකු වෙනුවෙන් නිකුත් කළ හැකි උපරිම ප්‍රමාණය කොපමණද යන්නත් මහ සභාවේ අනුමැතිය හා තීරණය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ගිය වර මහ සභාවේද සාකච්ඡා කර ගත් පරිදි ප්‍රාදේශීය සභාව මගින් නිෂ්පාදනය කරනු ලබන කොම්පෝස්ට් පොහොර කිලෝ එකක් සඳහා (1 kg ) මෙතෙක් විකුණුම් මිළ වූ රු.15.00 ක මුදල 2021.07.17 දින සිට රු.20.00ක මුදලකට අලෙවි කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ගමන් කිරීමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා පිළිසකර කර දීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මේ සඳහා අලුතින් සංවර්ධනය වන මාර්ගවලින් ගලවා ඉවත් කරන කුට්ටිගල් අතුරා දිය හැකි බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කාපට් කිරීමට නියමිත මාර්ග වලින් ගලවා ඉවත් කරන කුට්ටිගල් උපයෝගී කර ගෙන කාර්මික නිලධාරී මහතාගේ අධීක්ෂණය යටතේ මෙම මාර්ගය ප්‍රදේශවාසීනගේ ද ශ්‍රම දායකත්වය ඇතිව සකස් කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 03**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය මගින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කරන සිරිගල මොණරකැලේවත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ මූලික වැඩ කොටස් මේ වන විට අවසන් කර ඇති අතර එම මාර්ගය හරහා ගලා බසින ඔය හරහා පාලමක් ඉදිකිරීමට අවශ්‍ය වුවත් ඒ සඳහා ප්‍රතිපාදන සපයා ගැනීම අසීරු වී ඇති බැවින්  LDSP ව්‍යාපෘතිය මගින් මොණරකැලේවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කර ඇති මුදලින් පාලම ඉදි කළ යුතු ස්ථානයට කොන්ක්‍රීට් දැමීම සඳහාත්, එසේම මොණරකැලේවත්ත මාර්ගය ඉදි කිරීමේ කටයුතු වලදී අධීක්ෂණ කටයුතු සඳහා සම්මුඛ පරීක්ෂණයක් මගින් තාවකාලිකව බඳවා ගත් ආර්.එම්.මොහාන් චානක බණ්ඩාර වැඩ පරීක්ෂක මහතාට ගෙවීම සඳහා තිබූ මුදල් මේ වන විට අවසන් වී ඇති හෙයින් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කර ව්‍යාපෘතිය අවසන් කරන තෙක් එම අධීක්ෂණ කටයුතු සිදු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් දීමනා ගෙවීම සඳහාත් මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.  එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

අදාල ස්ථානයට කොන්ක්‍රීට් දැමීමේ සංවර්ධන කටයුත්ත අදාල ප්‍රතිපාදන වලට යටත්ව විධිමත් හා සුදුසු ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරීම සුදුසු බවත් වැඩ පරීක්ෂක මහතාට ගෙවීමට ඇති ඉතිරි මුදල්ද අදාල නිර්දේශයන්ට යටත්ව විධිමත් ආකාරයට සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවටත්  සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 04**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ කාර්ය සාධන වාරිකය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති  කොවිඩ් 19 සඳහා ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් පළාත් පාලන ආයතනය තුළ දුරකථන සේවා කවුළුවක් ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතන සඳහා එක් ආයතනයකට ට රු.300000/= ක මුදලක් වෙන් කරන ලෙසට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් කර ඇති දැනුම් දීම මත එම මුදල උපයෝගී කර ගනිමින් දුරකථන සේවා කවුළුවක් ආරම්භ කර පවත්වා ගෙන යා යුතු බවත්, ඉදිරි කාර්ය සාධන මුදල් ලබා දීමේදී මෙම කටයුත්ත ක්‍රියාත්මක කර ඇති ආකාරයේ ප්‍රගතිය සලකා බලන බවත්, පළාත් පාලන සහකාර

කොමසාරිස් කාර්යාලයේ පැවති දැනුවත් කිරීමේ වැඩසටහනකදී දැනුම් දී ඇති අතර, අප කාර්යාල පරිශ්‍රයේ මෙම දුරකථන සේවා කවුළුවක් පවත්වා ගෙන යාම සඳහාත් මේ සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් පත් කරවා ගැනීම සඳහාත්, මෙය පවත්වා ගෙන යාමට සුදුසු ස්ථානයක් සහ අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහාත් මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ගරු උප සභාපති ප්‍රදීප් විජේරත්න මහතා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ගිය වර සභාවේද සාකච්ඡා කර ගත් පරිදි මෙම දුරකථන සේවා කවුළුව ආයතනයේ දැනට ගිණිහට අංශය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුල්වන ස්ථානයේ ඇති කාමරය මේ සඳහා යොදා ගනිමින් එහි රථගාල පැත්තෙන් ප්‍රධාන කාර්යාලයට මුහුණලා දොරටුවක් සකස් කර ඒ සඳහා දැනට සිටින ගිනිහට අංශ ප්‍රධානීගේ මූලිකත්වයෙන් සහ අධීක්ෂණය, මෙහෙය වීම යටතේ ගිනිහට අංශයේ අනෙකුත් නිලධාරින් මේ සඳහා යොදවමින්, විධිමත් සැලැස්මක් සකස් කර මෙහි කටයුතු පවත්වා ගෙන යාම සුදුසු බවත්, මෙම සේවා කටයුතු දිවා රාත්‍රි දෙකෙහි ම අඛණ්ඩ සේවාවක් ලෙස Roster ක්‍රමය යටතේ සිදු කිරීම සුදුසු වන අතර, මෙම නිලධාරින්ගේ තනතුරුවලට අදාළ රාජකාරි කටයුතු මෙන් ම හදිසි රාජකාරි කටයුතු ද කොවිඩ් 19 තත්ත්වයට අදාළව පැවරෙන රාජකාරි කටයුතුවලට බාධාවක් නොවන අයුරින් මෙහි කටයුතු පවත්වා ගෙන යා යුතු අතර, මේ සඳහා විධිමත් සැලැස්මකට අනුව කටයුතු කළ යුතු බවත්, මෙම ප්‍රතිපාදන යටතේ කාර්මික නිලධාරි මහතාගේ ද සහයෝගය ඇතිව මෙම කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කර මේ සඳහා අත්‍යාවශ්‍ය උපකරණ ද මෙම ප්‍රතිපාදන යටතේ ම මිලදී ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 05**

මහජන ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ පළාත් පාලන ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමට අදාළව මොනරාගල ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 05 ක් වෙන් කර ඇති බව පළාත් පාලන කොමසාරිස්ගේ 2021.07.13 දිනැති ලිපිය මගින් දන්වා එවා ඇත. ඒ අනුව මොනරාගල ප්‍රාදේශිය සභා ක්‍රීඩාංගනය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහාත්, අමාත්‍යාංශය විසින් අනුමත මුදලට වඩා වැඩිපුර වැය වන මුදල ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවීමටත් මහ සභා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයජීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙහිදී සභාවෙන් කළ විමසීම් වලට අනුව මෙම ප්‍රතිපාදන වලට යටත්ව කළ හැකි වන පරිදි සභාව සතු පිට්ටනියේ භූමිය කපා මට්ටම් කර මාර්ගය පැත්තෙන් භාග තාප්පයක් බැඳ ඊට උඩින් ග්‍රිල් වැටක් යොදා අවශ්‍ය කාණු පද්ධතිය කපා සකස් කිරීමට සැලසුම් කර ඇති බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ප්‍රතිපාදන වලට යටත්ව අදාල ඇස්තමේන්තු හා වැඩ විස්තරයන්ට යටත්ව විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභාව සතු ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු සිදු කිරීම සුදුසු බවත්,මෙම ප්‍රතිපාදන වලට අමතරව යම් වැඩ කොටසක් කිරීමට සිදුවුවහොත් එම තත්ත්වයන් පිළිබඳව ඇස්තමේන්තු හා වැඩ විස්තරයන් සකස් කර ඒ සඳහා පූර්ව අනුමැතියක් ලබා ගැනීමෙන් අනතුරුව ඒ සඳහා ඉදිරි කටයුතු කිරිම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 06**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වාහන යන්ත්‍රෝපකරණ සඳහා අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියා සිදු කිරිම හා වාර සේවා සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංක | වාහන අංකය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | PF 7419 | වාර සේවා සිදු කිරිම | 27870.00 |
| 02 | 252-6330 | පිටුපස කැබ් කොටසේ ලොක් දෙක දැමීම | 3900.00 |
| 03 | 252-6330 | වාර සේවා සිදු කිරිම | 22120.00 |
| 04 | RS -1800 | කටින්තල, එන්බීඩ්, ශියර් පින් ආදි අමතර කොටස් ගැනීම | 142911.00 |
| 05 | RS -1800 | ග්‍රිස් බකට 1 ක් DS 40 එන්ජින් ඔයිල් ලීටර් 05 ක් මිලදී ගැනීම | 24400.00 |
| 06 | ZA 5061 | බැකෝලෝඩරය පිටුපස 19x24 petlas ටයර් 02 මිලදී ගැනීම | 239300.00 |
| 07 | ZA 5061 | බැකෝලෝඩරය ඉදිරිපස 14x17.5 ටයර් 2 සහ ටියුබ් 2 දැමීම | 133640.00 |
| 08 | ZA 5061 | Exide Battery N 120 | 31100.00 |
| 09 | LL 6980 | ඩ්‍රම් ට්‍රක් රථයට 900x20 ටියුබ් 01, ටේප් 01 | 4850.00 |
| 10 | LM 3078 | ගලි රථයේ 14x17.5 Ceat ටයර් 04 ක් මිලදී ගැනීම | 146840.00 |
| 11 | 49-5301 | වාර සේවා සිදු කිරිම | 17860.00 |
| 12 | 49-5301 | ටයර් මාරු කිරීම පැච් එකක් දැමීම | 1400.00 |
| 13 | 49-5301 | වෝල්ටනේටරය අළුත්වැඩියා කිරිම | 4990.00 |
| 14 | 49-5301 | වෝල්ටනේටරය අළුත්වැඩියා කිරිමට උපාංග මිලදී ගැනීම | 1470.00 |

| | | | |
|---|---|---|---|
| 15 | 37-9430 | වෝල්ටනේටරය අළුත්වැඩියාවට උපාංග මිලදී ගැනීම | 7770.00 |
| 16 | ZA 5061 | බැකෝලෝඩරය වාර සේවා සිදු කිරිම | 34704.31 |
| 17 | 252-6330 | ටැංකි මීටරය අක්‍රිය වීම නිසා ප්ලෝටරයක් මිලදී ගැනීම | 2400.00 |
| 18 | RS -1800 | කටින් තල සවි කිරිම | 4800.00 |
| 19 | LL 7682 | ටයර් 01, ටියුබ් 01, කොලර් 01 මිලදී ගැනීම | 23800.00 |
| 20 | කෘ කැබ් රථය | තට්ටුව ගලවා මෝල්ට් දමා සවි කිරිම | 9500.00 |
| 21 | කෘ කැබ් රථය | ස්ටාටර් මෝටර් ක්ලච් එක අළුත්වැඩියාව හා උපකරණ මිලදී ගැනීම | 8500.00 |
| 22 | GC5148 | ඉන්ධන ටැංකියේ අළුත්වැඩියාව, ඉදිරි පැති සංඥා පහන් අළුත්වැඩියාව | 7100.00 |
| 23 | RD 4488 | හිච් කූරු 01 ක් මිලදී ගැනීම | 2650.00 |

එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

නිසි ක්‍රම වේදයන්ට යටත්ව හා අදාල පරීක්ෂණ වාර්තා,නිර්දේශ කිරීම් හා අදාල අනුමැතීන්ට යටත්ව මෙම අලුත්වැඩියා කටයුතු සිදු කර මෙම ගෙවීම් කටයුතු සිදුකිරීමටත් ඒ සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරිම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 07**

ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කරන කාර්යය සාධනය සඳහා වන මූල්‍ය ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට යෝජනා කර ඇති පහත කාර්යයන් සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

I. මුහුණු ආවරණ ඇතුළු කොවිඩ් නිරෝධායන මධ්‍යස්ථාන වල බැහැර කරන කසල ඉවත් කිරීමට යොදා ගන්නා ට්‍රැක්ටර් රථයේ ට්‍රේලරය සකස් කළ යුතු ආකාරය (මොඩලය) සාකච්ඡා කර තීරණය කිරීම.

II. සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ ලබා දිය යුතු කාර්ය මණ්ඩලයට ප්‍රමුඛතාවය අනුව තීරණය කර දීම

III. දුරකථන මධ්‍යස්ථානයේ කටයුතු සිදු විය යුතු ආකාරය තීරණය කිරිම

IV. කොවිඩ් 19 විෂබීජහරණ කටයුතු සඳහා ඒකකයන් පිහිටුවීමටත්, එම ඒකකයන් යටතේ කටයුතු කිරිම සඳහා කාර්ය මණ්ඩලය වශයෙන් සුපරවයිසර් 01, රියදුරු 01,සේවක 03 ක් ලෙස නම් කර තීරණය කිරිම.

V. පොදු වෙළඳපොළ හා ආර්ථික මධ්‍යස්ථාන විෂබීජහරණ කිරීමේ ක්‍රමවේදය හා එය සිදු කරන කාර්ය මණ්ඩලය තීරණය කිරිම

VI. සෞඛ්‍යාරක්ෂිත උපකරණ හා විෂබීජානුහරණ ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා තාක්ෂණික සමාලෝචන කමිටුවක් පිහිටුවීමට සහා අනුමැතිය ලබා දීම

VII. ප්‍රාරම්භක කාර්ය සාධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා සකස් කරන ලද මොඩියුලය අනුමත කිරිම.

එම යෝජනාව සුදුසු බවට ගරු උප සභාපති ප්‍රදීප් විජේරත්න මහතා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටීමේදී පහත සඳහන් පරිදි මේ සඳහා සභා තීරණ ගන්නා ලදි.

I. දැනට මාලු අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා ආවරනය කරල ලද ට්‍රැක්ටර් ටේලරය මේ සඳහා යොදා ගැනීම සුදුසු බවත්,එම ට්‍රේලරයේ පවතින අඩු පාඩු සකස් කර, තීන්ත ආලේප කර මහජනතාවට කොවිඩ් පිළිබඳව දැනුවත් වීමක් ලැබෙන පරිදි අවශ්‍ය ස්ටිකර අලවා එය මනාව සකස් කර කොවිඩ් 19ට අදාල කසල ප්‍රවාහනය සඳහා යොදා ගැනීමට සුදුසු බව සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

II.කොවිඩ් 19ට අදාලව සභාව මගින් සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ ලබා දීමේදී මෙහි මූලික කටයුතු සිදුවන ආකාරයට අනුපිළිවෙලට මෙම උපකරණ ලබා දිය යුතු බවට සභාව පහත සඳහන් පරිදි එම අනුපිළිවෙල තීරණය කරන ලදි.

1. කොවිඩ් විෂබීජ හරන කටයුතුවල නිරත වන කාර්ය මන්ඩලය
2. කොවිඩ් මෘත ශරීර ආදාහනයට අදාලව සේවය කරන සේවක මන්ඩල
3. කොවිඩ් කසල ප්‍රවාහන කටයුතු වල නිරත වන සේවක මන්ඩල
4. කොවිඩ් හා හදිසි ආපදා සඳහා ප්‍රතාචාර දරක්වන මධ්‍යස්ථානයේ සේවය කරන කාර්ය මන්ඩලය
5. කසල ඉවත් කිරීමේ කටයුතු වල නිරත වන සේවක මන්ඩල

III. කොවිඩ් 19 හදිසි ආපදා පිළිබඳව ප්‍රතිචාර දැක්වීමේ දුරකථන මධ්‍යස්ථාන කටයුතු සෑම දිනකම පැය 24ම ක්‍රියාත්මක වන පරිදි පවත්වාගෙන යාමටත් මෙම මධ්‍යස්ථානයේ සේවය කිරීමට කලින් දැනුම් දී ඇති පරිදි ප්‍රාදේශීය සභාවේ ගිණිබට ඒකකයේ නිලධාරීන් රොස්ටර් ක්‍රමයට අනුව යෙදවීමටත්, මෙම කටයුතු වලට අදාලව මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව විසින් ඕනෑම අවස්ථාවක ලබා දෙන දුරකථන පණිවිඩ හා පැමිණ සිදු කරන දැනුම් දීම් වලදී ඉතා කඩිනමින් ප්‍රතිචාර දැක්වීමටත්,කොවිඩ් ආදාහන කටයුතුවලදී අදාල සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදු කිරීමටත්,ප්‍රධාන වශයෙන් මෙම ඒකකයේ වගකීම විය යුතු අතර ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාරම්භක කාර්යය සාධනය ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර ඇති මොඩියුලයට අනුව කාර්යයන්,ලේඛන හා ලිපිගොනු යාවත්කාලීනව පවත්වාගෙන යාමටත් මෙම ඒකකය මගින් සිදු විය යුතු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

IV. කොවිඩ් 19 විෂබීජ හරන කටයුතු සඳහා වෙනම ඒකකයක් පිහිටුවීම සුදුසු බවට සභාව තීරණය කළ අතර ඒ සඳහා සුපර්වයිසර් වරයකු,සේවකයින් තිදෙනෙකු, රියදුරෙකු සහ සහායකු සමඟ UP GC J148 (ගිණි නිවීමේ රථය) මෙම කටයුතු සඳහා යොදවා ගැනීම සුදුසු බවටත්,ඒ වගේම මෙම ඒකකය සඳහා ආයතනය මගින් නිකුත් කරනු ලබන විෂබීජ හරන ද්‍රව්‍ය සඳහා ලැබීම්, නිකුත් කිරීම්, වෙනුවෙන් ලේඛණ පවත්වාගෙන යා යුතු බවටත් සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

V.පොදු වෙළඳපොළ හා ආර්ථික මධ්‍යස්ථාන විෂබීජ හරනය කිරීමේ කටයුතු ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවා ඇති විෂබීජ හරන ඒකකය මගින් සිදු කිරීම සුදුසු බවත්, ආර්ථික මධ්‍යස්ථාන වල විෂබීජ හරන කටයුතු සඳහා විෂබීජ නාශක නිකුත් කිරීමේදී ඒ සඳහා වෙනම ප්‍රමාණයක් ගබඩා භාර නිලධාරී විසින් පවත්වාගෙන යාම සිදු විය යුතු බවටත් සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

VI. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාරම්භක කාර්යය සාධනය ක්‍රියාත්මක කිරීම යටතේ විෂබීජ නාශක ද්‍රව්‍ය හා ආරක්ෂිත උපකරණ මිළදී ගැනීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකුගේ සහාය ලබා ගැනීම සිදු කළ යුතු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

VII. ප්‍රාරම්භක කාර්යය සාධනය ක්‍රියාත්මක කිරීම සඳහා සකස් කර ඇති මොඩියුලය අනුමත කරන බවත්,ඉදිරියේදී අවශ්‍යනම් ඒ සඳහා සංශෝදන ඇතුලත් කිරීමට හැකි බවත් සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 08**

කොවිඩ් මෘතදේහ ආදාහනය කිරීම මේ වන විට රෝහල් කාර්ය මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, ඒ අනුව මෘත දේහ ප්‍රාදේශීය සභාවේ මැදිහත්වීමෙන් ආදහනය කිරීමට පියවර ගන්නා ලෙස ප්‍රෙදේශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කොවිඩ් වැඩමුළුවකදී දැනුවත් කර ඇති බැවින්, එම කටයුතු සිදු කිරීම සඳහා බැහැර කණ්ඩායමක් යොදවා ගත යුතු බැවින්, මේ සඳහා කණ්ඩායමක් පත් කර ඔවුන් සඳහා එක් මරණයක් ආදාහනය කිරීම සඳහා කොපමණ මුදලක් ගෙවිය යුතු ද යන්නත් තීරණය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

පසු ගිය දින පැවති කොවිඩ් කමිටුවේදී මොනරාගල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් බෝවන රෝග සම්බන්ධයෙන් පාලන කටයුතු ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බැවින් මොනරාගල ආදාහනාගාරය වෙත රැගෙන එන කොවිඩ් මෘත දේහ ආදාහනාගාර පරිශ්‍රයේදී ප්‍රාදේශීය සභාව මගින් භාර ගෙන ආදාහනාගාරය තුලට ඇතුලත් කිරීම හා දැවීම් කටයුතු සිදු කළ යුතු බවට මෙසේ උපදෙස් ලබා දී ඇති බව ගරු සභාපතිතුමන් සභාව දැනුවත් කර සිටින ලද අතර මේ සඳහා කාර්මික නිලධාරී මහතාගේ සහ වැඩ පරිපාලක මහතාගේ අධීක්ෂණය මත තිදෙනෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත්, මේ අය සඳහා දීමනා ගෙවීමට රු.100,000.00ක අත්තිකාරමක් සභා අරමුදලින් දැනට ලබා ගැනීමට සභා අනුමැතිය ලබා දෙන ලෙසත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොනරාගල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් දැනුම් දී ඇති පරිදි උපදෙස් පරිදි කොවිඩ් මරණ මොනරාගල ආදාහනාගාරයේදී ආදාහනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් අදාල සියලු ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත් එසේම මෙම මෘත දේහ රැගෙන ඇවිත් ආදාහනාගාරයට ඇතුලත් කර අදාල පිලිස්සීම් කටයුතු වලට භාර දීම සඳහා ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් වග කිව යුතු නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් සුදුසු පරිදි තෝරාගන්නා ලද තිදෙනෙකු මේ සඳහා යෙදවීම සුදුසු බවත්, මෙසේ පිලිස්සීමට දෛනිකව භාර දෙන එක් කොවිඩ් මරණයක් සඳහා එක් අයෙකු සඳහා රු.2000.00 බැගින් රු.6000.00ක දීමනාවක් සෑම කොවිඩ් මරණයක් සඳහාම සභා අරමුදලින් ගෙවීම සුදුසු බවත්,එසේම ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සියලු ද්‍රව්‍ය ඇතුලු පහසුකම්ද සභාවෙන් ලබා දීම සුදුසු බවටත්, මූලික වශයෙන් මේ සඳහා ගෙවීම් කිරීමට සභා අරමුදලින් රු.100,000.00ක අත්තිකාරමක් ලබා ගැනීමත් එය පියවීමෙන් පසු නැවත අදාල දීමනා සඳහා විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ගෙවීම් කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදි.

**යෝජනා අංක 09**

ගම සමග පිළිසඳර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රීඩාංගනය වටා ඇවිදින මංතීරුවක් සකස් කිරිමේ ව්‍යාපෘතිය සඳහා රු.2,467,405.31 ක මුදලක් අනුමත කර ඇති අතර, මෙම ව්‍යාපෘතිය ප්‍රසම්පාදන ක්‍රියාවලිය මත සිදු කළ යුතු බැවින් සහ ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය මත සිදුවන අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයක්, ටෙන්ඩර් විවෘත කිරිමේ කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරිම හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරිම සඳහාත් වෙනත් ආයතනවලින් පැමිණෙන නිලධාරින් හට ගෙවීම් කටයුතු සිදු කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ව්‍යාපෘතියට අනුව ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ මොනරාගල ක්‍රීඩාංගනයේ ඇවිදින මංතීරුව සකස්කිරීමට අදාල කටයුතු සිදු කිරීමේදී ක්‍රීඩා පිටියේ මීටර් 200ක ධාවන පථයට හානියක් නොවන පිරිදි එම සංවර්ධන කටයුතු සිදු කළ යුතු බවත් මේ සඳහා වෙළඳපොළ මිළ සැසඳුම් ක්‍රමය (SHOPING) යටතේ සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවා මෙම ටෙන්ඩරය පිරිනැමීමට පියවර ගැනීම සුදුසු බවත්,මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව මෙම පත් කර ඇති ප්‍රසම්පාදන හා මිළ ගණන් විවෘත කිරීමේ කමිටුව හා තාක්ෂණ ඇගයීම් කමිටුව සම්බන්ධ කර ගනිමින් මේ සඳහා අදාල කටයුතු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සිදු කිරිම සුදුසු බවත්, මෙම කමිටු සඳහා පිට ආයතන වලින් පැමිණෙන නිලධාරීන්ට අදාල දීමනා සහා අරමුදලින් ගෙවීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

මේ සඳහා සභාව අනුමත කරන ලද කමිටු ලෙස

**<u>ප්‍රසම්පාදන හා මිළ ගණන් විවෘත කිරීමේ කමිටුව</u>**

01.ආර්.එම්.රත්නවීර මහතා (ගරු සභාපති) -කමිටු සභාපති
02.ඒ.ඩී.සුනිල් අරංගල මහතා (ගරු මන්ත්‍රී) -කමිටු සාමාජික
03.ඩී.එම්. අනුර දිසානායක මහතා (සභා ලේකම්) - කමිටු සාමාජික
04.ඩබ්.එන්.පී.චන්ද්‍රපාල මිය (ප්‍රදාන කළමනාකරණ සහකාර) - කමිටු සාමාජික
05.මාලක සුරංග මහතා (සංවර්ධන නිලධාරී) - කමිටු සාමාජික
06.මානෙල් මංගලිකා මහත්මිය (විෂය භාර සංවර්ධන නිලධාරී) - කමිටු සාමාජික

**<u>තාක්ෂණ ඇගයීම් කමිටුව</u>**

01.අමිල රත්නායක මහතා -(ඉංජිනේරු) පළාත් පාලන කොමසාරිස් කාර්යාලය
02.සරත් කුමාර වනසිංහ මහතා - (කාර්මාක නිලධාරී) මොනරාගල ප්‍රාදේශීය සභාව
03.පී.එම්.පී. පතිරණ මහතා (ගණගාධිකාරී) - මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**යෝජනා අංක 10**

මොනරාගල, වැලියාය, පොතුවිල්පාර හි පදිංචි කේ.වයි.සන්ධ්‍යා කුමාරි මහත්මිය විසින් වැලියාය ග්‍රාම නිලධාරි වසම තුළ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් නොමැති බැවින්, මොනරාගල ප්‍රාදේශිය සභාවට අයත් වැලියාය පුස්තකාලය පිහිටි ඉඩමේ නව මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ආරම්භ කොට එය මොනරාගල ප්‍රාදේශිය සභාවේ පූර්ණ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යාම සඳහා කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ප්‍රදීප් ධම්මික විතානගේ ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම යෝජනාව ප්‍රාදේශීය වශයෙන් අවශ්‍යතාවයක් පවතින කටයුත්තක් වශයෙන් වැදගත් වන අතර මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් වැලියාය පුස්තකාලය පවතින ඉඩම තුළ දැනට පවතින ගොඩනැගිලි වලට අවහිරයක් නොවන අයුරින් පවතින කොන්දේසි හා නීති රීති වලට යටත්ව ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන පෙර පාසලක් වශයෙන් සුදුසුකම් සපුරා ඇති පළ පුරුදු ගුරුවරියකගේ ප්‍රධානත්වයෙන් නීත්‍යානුකූලව ආරම්භ කර පවත්වාගෙන යාම සුදුසු බවත්, මෙම පෙර පාසලේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජයේ වග කිව යුතු අංශ වෙත යොමු කර ලබා ගැනීමට කටයුතු කර විධිමත්ව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවත්, ඊට අමතරව සභා අරමුදලින් වියදම් දැරීමටත්, එසේම මෙම නව පෙර පාසලේ කටයුතු රටේ පවතින තත්ත්වයත් සමඟ ප්‍රාදේශවාසී දරුවන්ට මහඟු පිටුවහලක් වීම සඳහා 2022 වර්ෂයේ ජනවාරි මාසයේ සිටම ආරම්භ කිරීම සුදුසු බවත්,එම නිසා රජයේ ප්‍රතිපාදන මත ඒ සඳහා එම ස්ථානයේ නව ගොඩනැගිල්ල් ඉදිකරන තුරු එම භූමියේ භාවිතයක් නොමැතිව වසා ඇති හිස් ගොඩනැගිල්ලේ මෙම පෙර පාසල ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඒ සඳහා අත්‍යාවශ්‍ය ඩෙක්ස් පුටු ආදී උපකරණ සහා

අරමුදලින් සකස් කර දීමත්, ඒ වගේම දරුවන් බඳවා ගැනීමට අදාල අයදුම්පත්‍ර ප්‍රාදේශීය සභාව මගින් නිකුත් කිරීම සුදුසු බවටත් යන කාරණා සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 11**

මොනරාගල ප්‍රාදේශීය  සභාව මගින් අය කරනු  ලබන වරිපනම් බදු, කඩ කුලී නොගෙවන අයගේ දේපල තහනමට ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කරන ලෙස විගණන විමසුමේ දක්වා ඇති බැවින්, 2020 වර්ෂයේ රටේ පැවති වසංගත තත්ත්වය අනුව දේපල තහනමට නොගත් අතර, 2021 වර්ෂයේ අදාළ නිවෙස්වලට ගොස් මේ සම්බන්ධව කළ දැනුවත් කිරීමෙන් පසුව අදාළ බදු කුලී කොටසක් ගෙවා අවසන් කර ඇති නමුත්, නොගෙවන බදු කුලී වෙනුවෙන් අදාළ අයගේ දේපල තහනමට ගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයසීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර රටේ පවතින තත්ත්වය මත මෙසේ දේපළ තහනමට ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් නොයෙක් විරෝධතා ඉදිරිපත් වූ බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

කොවිඩ් වසංගතයත් සමඟ ජනතාව දැඩි පීඩනයකින් පීඩා විඳින මොහොතක මෙසේ දේපළ තහනමට ගැනීම සුදුසු ක්‍රියාවක් නොවන බැවින් මෙම තත්ත්වය යථා තත්ත්වයට පත් වූ පසු මෙවැනි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී පියවර ගනිමු බවත්,එතෙක් මෙම අයගේ හිඟ මුදල්  වාරික වශයෙන් හෝ හැකි අයුරින් අය කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවටත් සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 12**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2021 ප්‍රජා ජල සම්පාදන වැඩසටහනට අනුව මොනරාගල ප්‍රාදේශීය සභාව මගින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් ව්‍යාපෘති සඳහා රු.ලක්ෂ දෙක බැගින් වූ ප්‍රතිපාදන මුදලක් වෙන් කර ක්‍රියාත්මක කිරීම සඳහා අප වෙත දැනුම් දී ඇති බැවින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් තවද මේ සඳහා වෙන් වී ඇති ප්‍රතිපාදන මුදලට වඩා වැඩියෙන් ඇස්තමේන්තු ගත වී ඇති මුදල සභා අරමුදලෙන් ගෙවීමටත් මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංකය | කර්මාන්තයේ නම | වෙන් කරන ලද මුදල | ඇස්තමේන්තුගත මුදල |
|---|---|---|---|
| 01 | සිල්බර් පාර, සිරිපුරයාය ඩී.එම්.ලක්මාල් ප්‍රියංකර මහතාගේ ඉඩමේ පොදු ලිඳ ඉදි කිරීම | රු.200000.00 | රු.224539.23 |
| 02 | හුලංදාව දකුණ ගැමුණුපුර බී.එම්. හීංමැණිකා මහත්මියගේ ඉඩමේ පොදු ලිඳ ඉදි කිරීම | රු.200000.00 | රු.224404.06 |

| | | | |
|---|---|---|---|
| 03 | දෙබැද්දකිවුල, දික්තලාව, කනත්ත පාර ඩී.එම්.චන්ද්‍රපාල මහතාගේ ඉඩමේ පොදු ළිඳ ඉදි කිරීම | රු.200000.00 | රු.224738.74 |
| 04 | ගඩොල්බැද්ද ඩී.එම්.විශ්ව නිපුන් මහතාගේ ඉඩමේ පොදු ළිඳ ඉදිකිරීම | රු.200000.00 | රු.223569.66 |

එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ව්‍යාපෘතීන්ට සහ වැඩසටහන්වලට අදාලව ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව වෙන් කර ඇති මෙම පොදු ළිං 04 එම ස්ථානවල ඉදිකිරීම සුදුසු බවටත්,මේ සඳහා අමතර වියදම් වන මුදල් ශ්‍රම දායකත්වයෙන් සහ පාරිභෝගික ප්‍රජාවගේ මැදිහත් වීමෙන් සිදු කිරීමට පියවර ගැනීමට ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාත්මක වීම සුදුසු බවත් ඉදිරි නියං සහිත කාලයන්ට ප්‍රථම මෙම ඉදිකිරීම් කටයුතු අවසන් කර එම ප්‍රදේශවාසීන්ට භාර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 13**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් පොදු වෙළඳ සංකීර්ණය හා පැරණි බස් නැවතුම්පොළ පිහිටි ඉඩම් සහ ප්‍රාදේශිය සභා ක්‍රිඩා පිටිය මැනීම් කර සමෝච්ඡ රේඛා පිඹුරුපත් සැකසීම සඳහාත් ඒ සඳහා වැය වන මුදල් සභා අරමුදලින් ගෙවීමටත් මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

රජය මගින් විටින් විට ලබා දෙන උපදෙස් අනුව සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේදී එම සංවර්ධන කටයුතු සිදුකරන ස්ථානයන්ට අදාලව සමෝච්ඡරේඛා පිඹුරු පත් හා සිතියම් සකස් කිරීමට සිදුවන බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ඉදිරිපත් කරන ලද මෙම යෝජනාවට අදාලව ප්‍රා දේශීය සභාවට අයත් පොදු වෙළඳ සංකීර්ණය ,පැරණි බස් නැවතුම්පල පිහිටි ඉඩම හා ප්‍රා දේශීය සභා ක්‍රීඩාපිටියේ අදාල මැනුම් කටයුතු සිදුකර ඒ සඳහා සමෝච්ඡරේඛා පිඹුරු පත් සකස් කර ඒ වෙනුවෙන් වැය වන ගාස්තු විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව සභා අරමුදලින් ගෙවීම් කිරීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 14**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සිදු කිරිමට නියමිත පහත සඳහන් අත්‍යාවශය සංවර්ධන කටයුතු සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

I. පින්ගොල්ල මාර්ගය කොන්ක්‍රිට් කිරිම (දළ ඇස්තමේන්තුව රු.500000.00)

I. මොනරාගල ප්‍රාදේශීය සභා පැරණි පුස්තකාල ගොඩනැගිල්ලේ වහලය සහ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදු කිරිම (දළ ඇස්තමේන්තුව රු.150000.00)

II. වැලියාය මහජන පුස්තකාලයේ ඉදිරිපස ඇති කියවීම් ශාලාවේ බිම කපලාරු කර සිමෙන්ති මැදීම.( දළ ඇස්තමේන්තුව රු.45000.00)

III. මොනරාගල ආදාහනාගාරය සඳහා ගබඩා කාමරයක් ඉදිකිරිම ප්‍රමානය: අඩි 17x14 (ඇස්තමේන්තු මුදල රු.616000.00)

එම යෝජනාවන් සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව  සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

සභා අරමුදලේ ප්‍රමාණවත් මුදල් පවතින අවස්ථාවන් වලදී විධිමත් ක්‍රමවේදයන්ට යටත්ව ඇස්තමේන්තු ප්‍රකාරව මෙම අත්‍යාවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරිම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 15**

මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වරිපනම් බදු අය කරන සීමාව තුළ පිහිටි කුඹුරු ඉඩම් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වරිපනම් බදු අය කිරිම සඳහා වාර්තා ලබාදී ඇති බැවින්, එම කාලයේ සිට මේ දක්වා එම ඉඩම් සඳහා වරිපනම් බදු අදාළ ලේඛන තුළ ගණනය වෙමින් පවතී. එම කුඹුරු ඉඩම් පරිහරණය කරනු ලබන ගොවීන් එම කුඹුරු ඉඩම් සඳහා ම අක්කර බදු ගෙවීම ගොජන සේවා ආයතනය වෙත ගෙවීම මත ප්‍රාදේශිය සභාව වෙත වරිපනම් බදු ගෙවීම සිදු නොකරයි. එබැවින් මෙම තොරතුරු ප්‍රාදේශීය සභා ලේඛනවලින් හා ගිණුමෙන් ඉවත් කිරිම(2021.12.31 දිනට මෙම හිඟ ශේෂය රු.407,841.68)  සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.  එම යෝජනාව සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

පසු ගිය සභා වාරයකදී මේ පිළිබඳව සාකච්ඡා කර අනුමත කළද එය න්‍යාය පත්‍රයට ඇතලත් වී නොතිබුණු නිසා මෙවර එය නැවත ඉදිරිපත් කළ බව ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන්ගේ කුඹුරු ඉඩම් සඳහා අදාල අක්කර බදු ගොවිජනසේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේනම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛන වල බිල් ගතව ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාල බිල් කිරීම් නතර කිරීම සුදුසු බවත්,එම ඉඩම් සඳහා මෙතෙක් පවතින අය කර ගැනීමට නොහැකි රු.407,841.68 ක හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛණ වලින් කපා ඉවත් කිරිම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 16**

සෙනුර සිවිල් ඉංජිනේරු පෞද්ගලික සමාගම හි කුඹුක්කන වැඩබිම් කාර්යාලයේ කළමණාකරු, ඊ.රුචිර රොෂාන්ත මහතා විසින් අතිගරු ජනාධිපතිතුමන්ගේ සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන යටතේ සිදු කරන මොනරාගල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු කිරිමට හඳුනා ගෙන ඇති මාරාව පන්සල් වත්ත මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය බොරළු පස් හා ABC ගබඩා කිරිම සඳහා අප ප්‍රාදේශිය සභාවට අයත් හුලංදාව වම පන්සල්වත්ත මාර්ගයේ පිහිටි ඉඩම ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීමට අනුව මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රිතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී මේ සඳහා මෙම භූමිය ලබා දීම වරදක් නොමැති බවත්,නමුත් ඔවුන්ගේ අදාල කටයුතු අවසන් වූ පසු මෙහි ක්‍රීඩා පිටිය ඩෝසර් කර කපා සකස් කර දෙන ලෙස ඔවුන් පොරොන්දු කර ගත යුතු බවට සභාවේ සාකච්ඡා විය.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

ප්‍රාදේශීය සභාව සතු හුලංදාව වමේ හතරමන් හංදියේ පවතින ඉඩම මේ සඳහා ලබා දීම සුදුසු බවත්,එසේම අදාල වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ලබා ගැනීමට යටත්ව අවශ්‍ය කරුණු කාරණාවන්ට යටත්ව අදාල මාර්ගයේ සංවර්ධන කටයුතු අවසන් වන තෙක් මෙම භූමිය කුඹුක්කන සෙනුර සිවිල් ඉංජිනේරු පෞද්ගලික සමාගම වෙත ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 17**

මොනරාගල ප්‍රාදේශීය සභාවට අයත් නව බස් නැවතුම්පල කඩ කාමර 2021 වර්ෂය සඳහා බදු දී ඇති අතර, එම බදු ගන්නා ලද කඩ කාමරවලට අදාළ ප්‍රධාන මුදල් 2020.12.25 වන දිනට පෙර සම්පූරණයෙන්ම ගෙවා අවසන් කරන ලෙස බදු කරුවන් වෙත දැනුම් දුන් අතර, එම දැනුම් දීමට අනුව බදුකරුවන් කිහිප දෙනෙක් පමණක් ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර ඇත. අනෙක් බදුකරුවන් වෙත අවස්ථා කිහිපයකදී වාචිකව සහ දුරකථන මාර්ගයෙන් එම මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇත. (2021.06.30 වන දිනැති ලිපිය මඟින් හා 2021.07.31 දිනට පෙර ප්‍රධාන මුදල අනිවාර්යෙන්ම සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කරන ලෙසට අවසන් වරට දන්වා යවන ලදී.) එහෙත් මේ වන විටත් පහත විස්තර සඳහන් කරන බදු කරුවන් විසින් ප්‍රධාන මුදල් ගෙවා අවසන් කර නොමැති අතර, ඒ සම්බන්ධව මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංක | කඩ කාමර අංකය | බදුකරුගේ නම | ප්‍රධාන මුදල | ගෙවා ඇති මුදල | ගෙවීමට ඇති මුදල |
|---|---|---|---|---|---|
| 01 | බිම් මහළ අංක 02 | එච්.පී. අජිත් ඉන්දුසිරි මහතා | 3,601,350.00 | 1,607,350.00 | 1,994,000.00 |
| 02 | 06 (උඩු මහළ) | කන්දසාමි දේවකුමාරි මිය | 1,700,600.25 | 425,150.06 | 1,275,450.19 |
| 03 | 08 (උඩු මහළ) | ඩබ්.සමීර මාදම්පිටිය මහතා | 1,910,000.00 | 477,500.00 | 1,432,500.00 |
| 04 | 09 (උඩු මහළ) | ඊ.එම්.සංජීව උදය කුමාර මහතා | 2,050,000.00 | 512,500.00 | 1,537,500.00 |
| 05 | 10 (උඩු මහළ) | ඒ.කපිල චමින්ද කුමාර මහතා | 1,799,127.00 | 450,000.00 | 1,349,127.00 |
| 06 | 20 (උඩු මහළ) | ආර්.ඒ.පැතුම් නිලංගිකා මිය | 2,100,325.50 | 525,081.37 | 1,575,244.13 |

එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කඩ කාමර බදු ගත් අය විසින් එසේ බදු ගෙන ඇත්තේ තමන්ට ගෙවීම් කිරීමට හැකියාව ඇති බැවින් වන අතර මෙම ප්‍රධාන මුදල් හා වාරික මුදල් දිගින් දිගටම ගෙවීම පැහැර හැරීම ගිවිසුම් කොන්දේසි උල්ලංගනය කිරීමක් හා මූලික කොන්දේසි උල්ලංගනය කිරීමක් බැවින් මෙම ප්‍රදාන මුදල් ඉතාමත් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර 2021.09.30 වන දිනය වන විට මෙම හිඟ මුදල් අය කර ගැනීමට බදුකරුවන් වෙත දැනුම් දිය යුතු බවට සභාව ඒකමතිකව තීරණය කළ අතර එම දිනය වන විටත් අදාල මුදල් ගෙවා අවසන් කිරීමට නොහැකි බදු කරුවන් සිටීනම් එම කඩ කාමර සම්බන්ධව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධව ඊලඟ මහ සභාවට වාර්තා කරන ලෙසත් මහ සභාව තීරණය කළ අතර මෙලෙස කොටසක් පමණක් මුදල් නොගෙවීම සමස්ථ මුදල් ගෙවා

අවසන් කර ඇති අයවලුන්ට කෙරෙන අසාධාරණයක් බැවින් මේ සම්බන්ධව අදාලබදුකරුවන් වෙත කඩිනමින් දන්වා යැවීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 18**

මොනරාගල ප්‍රාදේශිය සභාවට අයත් වෙළඳසැල්වලින් බදු මුදල් අය කිරිමේදී කොරෝනා වසංගතය හේතුවෙන් රට වසා තැබූ කාලසීමාවට අදාළව මාස 02 ක් සඳහා බදු මුදල් අඩු කර දෙන ලෙසට බදුකරුවන් විසින් ඉල්ලීම් කරන බැවින් ඒ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට වයි.උපුල් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.
රටේ පවතින තත්ත්වයත් සමඟ පවතින දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපාර කටයුතු නිසි ලෙස කරගෙන යාමට නොහැකිවීම යන කරුණු පදනම් කර ගෙන මෙම ඉල්ලීමට අනුව 2021 වර්ෂයේ මැයි සහ ජුනි යන මාස දෙකේ මෙම බදු කරුවන්ගෙන් බදු අය නොකර සිටීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 19**

2021 වසරේ මුල් මාසවල සතිපොළ නිසි පරිදි පැවතිය ද අප්‍රේල් මාසයෙන් පසුව මාස 03 කට ආසන්න කාලයක් සතිපොළ වසා තැබීම මත සහ රටේ පවතින වත්මන් තත්ත්වයක් සමග පොළට පැමිණි වෙළඳුන්ගෙන් 60% ක ප්‍රමාණයක් අඩුවී ඇති බැවින් වර්තමානය වන විට ගෙවීමට ඇති මාසික වාරිකය වන රු.455000.00 ක් වන මුදල අය කර ගැනීමේ හැකියාවක් නොමැති හෙයින් යම් බදු සහනයක් ලබා දෙන ලෙස ඩී.එම්.තක්ෂිලා මධුවන්ති වන බදුකරු විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට රංජිත් රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

බදු කරු විසින් දිගින් දිගටම මෙවැනි ඉල්ලීම් සිදු කිරීම හේතුවෙන් එවැනි අවස්තාවලදී පවත්න තත්ත්වයන් සලකා බලා බොහෝ සහනයන් ලබා දීමට සභාව පියවර ගෙන ඇති අතර ගිවිසුම් ප්‍රකාරවද මෙවැනි අවස්ථාවලදී සුදුසු ආකාරයෙන් සහන ලබා දීමට හැකි වුවත් දිගින් දිගටම එවැනි ආකාරයෙන් කටයුතු කිරීම සුදුසු නොවන කටයුත්තක් බවටත් නමුත් රටේ පවතින තත්ත්වයට අනුව මෙම ඉල්ලීමටද සාධාරණයක් ඉටුකළ යුතු බවට සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

ඉන් අනතුරුව මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ නැවත සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

රටේ පවතින කොරෝනා වසංගතයත් සමඟ වරින් වර සිදුකරනු ලබන නිරෝධායන ඇදිරිනීති තත්ත්වයන් සමඟ සතිපොළ පවත්වාගෙන යාමට බාධාකාරී තත්ත්වයන් ඇතිවීමට ඉඩ ඇතැයි උපකල්පනය කිරීමට හැකි බැවින් බදු කරු හට දන්වා යැවීමෙන් අනතුරුව මෙම වර්ෂයේ ඉදිරි කාල සීමාව තුලදී එනම් සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මාසය දක්වා මෙම බදු කරුගෙන් පොළ බදු අය කිරීම ඉවත් කර ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂකවරු යොදවා ඉදිරි මාස 4 තුළ පොළ බදු අය කිරීම සුදුසු බවත්, මෙසේ පොළ පැවැත්වෙන දිනවලදී පොළට පැමිණෙන වෙළෙඳුන් සංඛ්‍යාව හා අයකරනු ලබන බදු මුදල් පිළිබඳව සවිස්තර තොරතුරු තබා ගැනීම ඔවුන් විසින් සිදු කළ යුතු බවත්, සභාව ඒකමතිකව තීරණය කරන ලදි. සති පොළේ මෙම ඉල්ලීමට අනුව සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී සුනිල් අරංගල මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

මොනරාගල, කුඹුක්කන,ගල්වල පාර හී පදිංචි ඩබ්.ආර්.එම්.ආනන්ද පුෂ්පකුමාර මහතා විසින් තම නිවසට යන මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින අතර මෙම තත්ත්වය බෝක්කු යොදා සකස් කර ගැනීම මත මෙය විසදා ගැනීමට හැකි වන අතර මේ සඳහා අවශ්‍ය වන බෝක්කු කටන් 04ක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමට අනුව කාර්මික නිලධාරී මහතාගේ නිර්දේශ හා උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව විධිමත් ක්‍රමවෙදයන්ට යටත්ව මෙම සිලින්ඩර 04 සභාව මගින් මිළ දී ගෙන ලබා දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

## 5.2 ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චාමර නානායක්කාර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා

**යෝජනා අංක 01**

බිබිල පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අසල ජන වසම නිලධාරින්ට බෙදා වෙන් කරන ලද ඉඩම් කට්ටි සමග පිහිටි පොදු කටයුතු සඳහා වෙන් කර ඇති ඉඩම් කැබලි 02 මොනරාගල ප්‍රාදේශිය සභාවට පවරා ගැනීමට සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සුනිල් අරංගල ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙම ඉඩම් කැබලි පළාත් පාලන ආයතන වෙත පවරා ගැනීම සිදු කළ යුතු බවත්,පිටස්තර කිසිවෙකුට මෙම ඉඩම් කොටස් අත් පත් කර ගැනීමට අවසර නොමැති බවටත් සභාවේ සාකච්ඡාවට බඳුන් විය.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් නැවත සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉඩම් කොටසින් පළාත් පාලන ආයතනය වෙත ලබා දිය යුතු භූමි ප්‍රමාණය නිසි පරිදි ඔප්පුවක් මගින් ලබා දිය යුතු බවත්,එසේ විධමත්ව ලබා දෙන තෙක් එම ඉඩම් කට්ටි සැලැස්ම අනුමත නොකල යුතු බවත්,පිටස්තර කිසිවෙකුට එම ඉඩම් කොටස් අත් පත් කර ගැනීමට හැකියාවක් නොමැති බවත් එසේම සභාවේ ඉදිරි පොදු අවශ්‍යතාවයන් වෙනුවෙන් මෙම ඉඩම් කොටස යොදවා ගැනීමට කටයුතු කිරීම සුදුස බවත් සභාව ඒකමතිකව තීරණය කරන ලදි.

**යෝජනා අංක 02**

නක්කල ග්‍රාම නිලධාරි වසමේ කිරි ගම්මාන මාර්ගයේ සිට අමුණුදෝව දක්වා නව විකල්ප මාර්ගයක් සකස් කිරිමට ගම්වාසීන් යෝජනා කර ඇති හෙයින්, ඒ සඳහා සියළුම ඉඩම් හිමිකරුවන් ඉඩම් කොටස් පරිත්‍යාග කිරිමට ඉදිරිපත්ව ඇති හෙයින් මේ සඳහා සභාවේ යන්ත්‍රෝපකරණ යොදා කිරි ගම්මානයේ සිට අමුණුදෝව දක්වා අඩි 20 ක මාර්ගයක් කපා සකස් කර ගැනීම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බවට ගරු සභාපතිතුමන් ප්‍රකාශ කර සිටි අතර ඒ අනුව කටයුතු කර දීම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 03**

නක්කල කිරි ගම්මානයේ සිට අමුණුදෝව දක්වා විදුලි රැහැන් ඇද ඇති ලී කණු 15 ක් පමණ දිරාපත්ව ගොස් විශාල අවධානමක් පවතින බැවින් ප්‍රාදේශීය සභාව මගින් විදුලි බල මණ්ඩලයට මේ සම්බන්ධව දැනුම් දී නව කොන්ක්‍රීට් කණු පද්ධතියක් මත මෙම විදුලි රැහැන් යළි ස්ථාපිත කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට චාමර නානායක්කාර ගරු මන්ත්‍රීතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම අවධානම් තත්ත්වය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා විදුලි බල මණ්ඩලය වෙත දන්වා යැවීමට කටයුතු කිරිම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**5.4 ගරු සභාපති ආර්.එම්.රත්නවිර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 01**

මොනරාගල බල ප්‍රදේශයේ පෙර පාසල් ගුරුවරුන් හට NVQ මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලාවන් මේ වන විට මොනරාගල පුස්තකාල ශ්‍රවණාගාරයේ පවත්වා ගෙන යන අතර, මේ සඳහා නාම පුවරුවක් ස්ථානගත කිරිම සඳහා සුදුසු ස්ථානයක් වෙන් කර දෙන ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, දිස්ත්‍රික් මුල් ළමා විය සංවර්ධන නිලධාරි විසින් කර ඇති ඉල්ලීම සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට කේ.එම්. ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ස්ථානයේ දැන්වීම් පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දීම සම්බන්ධයෙන් සොයා බලා තීරණයක් ගත යුතු බැවින් මේ සඳහා පසුවට තීරණය කිරිම සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**යෝජනා අංක 02**

මොනරාගල නගර සීමාවේ ස්ථාපනය කිරිම සඳහා සංචාරක ප්‍රවර්ධන නාම පුවරු 03 ක් හා ආලෝක පුවරු 05 ක් සැකසීම සඳහා ක්‍රිඩා හා යෞවන කටයුතු සංචාරක ප්‍රවාහන සංස්කෘතික හා ජේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් රු.563,380.00 ක මුදලක් අනුඥාත කර ඇති බැවින්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට ක්‍රිශාන්ත රත්නායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

මෙවැනි සංචාරක පුවරු ප්‍රදර්ශනය කිරීමේදී කොට්ඨාශයේ වැදගත් කමක් සහිත ස්ථාන හා පෞරාණික වටිනාකමක් ඇති ස්ථාන සඳහා ප්‍රමුඛස්ථානයක් දීම සුදුසු බවට සභාවේ සාකච්ඡා වූ අතර ඒ සඳහා මරගල කන්ද,මයුරගිර ලෙන් විහාරය වැනි ස්ථාන හඳුන්වා දෙන ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් නැවත සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම සංචාරක නාම පුවරු ප්‍රදර්ශණය කිරීමේදී විදුලි ආලෝකය ලබා ගැනීමට හැකි සහ සුදුසු ස්ථාන ලෙස කුඹුක්කන සංචාරක ස්ථානය,වැලියාය ප්‍රදේශයේ සුදුසු ස්ථායක් සහ මහානාම ජාතික පාසල ඉදිරිපිට විවේක නැවතුම් ස්ථානය යන ස්ථානයන් සුදුසු බවට සභාව ඒකමතිකව අනුමත කරන ලදී.

**5.4 ගරු සභාපති ආර්.එම්.රත්නවීර මහතා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**යෝජනා අංක 03**

මොනරාගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පහත නම් සඳහන් අය විසින් වැසිකිළි ආධාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. මෙම ඉල්ලුම්කරුවන් අඩු ආදායම්ලාභින් ලෙස අදාළ ග්‍රාම නිලධාරින් විසින් සහතික කර ඇත. ඒ අනුව මොනරාගල ප්‍රාදේශීය සභාව 2021 වර්ෂයේ අය වැය යෝජනා මගින් බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි පහසුකම් වෙනුවෙන් ද්‍රව්‍යාධාර ලබා දීම සඳහා රු.1000000.00ක ප්‍රතිපාදන වෙන් කර ඇති බැවින්, එම ප්‍රතිපාදන මගින් පහත සඳහන් තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි ද්‍රව්‍යාධාර ලබා දීමට මහ සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාව වෙත යෝජනා කර සිටින ලදී.

| අනු අංක | වසම | ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | ඉල්ලුම් කරන ද්‍රව්‍ය |
|---|---|---|---|
| 01 | 129/එෆ්. විහාරමුල්ල | එම්.බි. ඉනෝකා නිලන්ති, අංක 100, දුටුගැමුණු පාර, මොණරාගල | සිමෙන්ති මලු 7 පෝච්චියක් |
| 02 | 129/එෆ්. විහාරමුල්ල | ටි.එම්. විමල්බන්දු, දුටුගැමුණු පාර, මොණරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 1 |
| 03 | 129/එෆ්. විහාරමුල්ල | ආර්.එම්.ඥාණවති, අංක 46, එඩරුලන්ද, විහාරමුල්ල, මොණරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 1 |
| 04 | 129/එෆ්. විහාරමුල්ල | ආර්.එම්. ශ්‍රී නාත් චතුරංග, විහාරමුල්ල, එඩරුලන්ද, මොණරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 1 |
| 05 | 129/බි මොණරාගල | සෙල්වරාජා, පොතුවිල් පාර, පින්නගොල්ල, මොණරාගල | සිමෙන්ති මලු 7 පෝච්චියක් |
| 06 | 129/එෆ්. විහාරමුල්ල | එස්.ජී සුනේත්‍රා කුමාරි, අංක 49, දුටුගැමුණු පාර, මොණරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 1 |
| 07 | 129/එෆ්. විහාරමුල්ල | ඩබ්.ජී රණසිංහ, 4/20, පළමු පටුමග, දුටුගැමුණු පාර, මොණරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 1 |
| 08 | 129/එෆ්. විහාරමුල්ල | ඩී.ජේ ආර්. පත්මලතා මැණිකේ, සාප්පුවත්ත, වෙලේවත්ත, මොණරාගල | සිමෙන්ති මලු 7 පෝච්චියක් |
| 09 | 129/එෆ්. විහාරමුල්ල | ඒ.එම්. කමලාවති, 5/75, ඇනිකට් පාර, මොණරාගල | සිමෙන්ති මලු 7 පෝච්චියක් |
| 10 | 129/එෆ්. විහාරමුල්ල | ඩී.එම්. රම්‍යලතා,42/6, දුටුගැමුණු පාර, මොණරාගල | සිමෙන්ති මලු 7 පෝච්චියක් |
| 11 | 129/D හිදිකිවුල | ටි.එම්.එල් දිල්ශාන්, බෝගහ අරාව පාර, හිදිකිවුල, මොනරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 6 |
| 12 | 129/D හිදිකිවුල | ඩී.එම්. ජිනදාස ඔයබඩවත්ත අසල, හිදිකිවුල මොනරාගල | ළිං වලලු 3 සිමෙන්ති මලු 6 |

| | | | |
|---|---|---|---|
| 13 | 130/A<br>නක්කල | ආර්.එම්. කරුණාවතී, බදුලුවත්ත,<br>22 කණුව, නක්කල, මොනරාගල | ළිං වලලු 3<br>සිමෙන්ති මලු 6 |
| 14 | 129/D<br>හිදිකිවුල | ආර්.එම්.චන්ද්‍රානි, අංක 33/2, බෝගහ අරාව පාර, හිදිකිවුල, මොනරාගල | ළිං වලලු 3<br>සිමෙන්ති මලු 6 |
| 15 | 129/D<br>හිදිකිවුල | ආර්.එම්. කාංචනා<br>නො 24/A, රත්මල් මාවත, හිදිකිවුල, මොනරාගල | සිමෙන්ති මලු 7<br>කම්බි (10mm) -4<br>පෝච්චියක් |
| 16 | 129/C,<br>හුලංදාව | ඩි.එම් පද්මසිරි, වැව අසල නිවස, පට්ටියලන්ද, මොණරාගල | වැසිකිළි පෝච්චියක්<br>සිමෙන්ති මලු 7<br>කම්බි (10mm) -4 |
| 17 | 129 මුප්පනේ | ඒ.ජේ.එම්. ප්‍රසන්න කුමාරසිරි, නො.141/1, කුමාරපුර 2 වන මාවත, දොඩම්වත්ත, | ළිං වලලු 3<br>සිමෙන්ති මලු 03 |

| | | | |
|---|---|---|---|
| 18 | 129 මුප්පනේ | ආර්.එම් අනුලා වති<br>, දොඩම්නත්ත මොනරරගල | වැසිකිළි පෝච්චියක්<br>සිමෙන්ති මලු 7<br>කම්බි (10mm) -4 |
| 19 | මුප්පනේ | එම්.එච්. ගයාන් සනත් කුමාර, කුමාරතුංග මාවත, මොණරාගල | වැසිකිළි පෝච්චියක්<br>සිමෙන්ති මලු 7<br>කම්බි (10mm) -4 |
| 20 | 129/C,<br>හුලංදාව | ඩි.එම්. පුෂ්පලතා,කනත්ත පාර, පට්ටියලන්ද, මොණරාගල | වැසිකිළි පෝච්චියක්<br>සිමෙන්ති මලු 7<br>කම්බි (10mm) -4 |
| 21 | 129 මුප්පනේ | ආර්.එම්. චූලනි ගීතිකා, 3 වන පටුමග, දොඩම්වත්ත, හුලංදාව , මොණරාගල | ළිං වලලු 3<br>සිමෙන්ති මලු 3 |
| 22 | 131/ඒ<br>කුඹුක්කන | ඒ.එම්. ගිම්හානි දුලක්ෂි වාසනා,<br>සිල්බර පාර , කුඹුක්කන | ළිං වලලු 3<br>සිමෙන්ති මලු 6 |
| 23 | කුඹුක්කන | ඉසිරු තරංග, සිල්බර පාර, කුඹුක්කන | ළිං වලලු 3 ,<br>සිමෙන්ති මලු 6 |
| 24 | 131/ඒ<br>කුඹුක්කන | ඩි.එම්.කරුණාරත්න<br>2 කණුව , කුඹුක්කන, මොණරාගල | ළිං වලලු 3 ,<br>සිමෙන්ති මලු 6 |
| 25 | 131/ඒ<br>කුඹුක්කන | ජේ.ඒ. දිලාන් චතුරංග ජයසිංහ<br>සිල්බර පාර, කුඹුක්කන | ළිං වලලු 3,<br>සිමෙන්ති මලු 6 |
| 26 | අලියාවත්ත | එම්. ආනන්ද රාජා,<br>අලියාවත්ත, මොණරාගල | සිමෙන්ති මලු 9,<br>මැටල් කියුබ්1/4,<br>වැලි කියුබ් ¼,<br>බිලොක් ගල් 100,<br>කම්බි (10mm) -8 |
| 27 | අලියාවත්ත | පෙරුමාල් විජේකුමාර්, අලියාවත්ත, මොණරාගල | සිමෙන්ති මලු 9,<br>ළිං වළලු<br>3ක්,පෝච්චියක්<br>කම්බි (10mm) -4 |
| 28 | අලියාවත්ත | සුබ්‍රමනියම් රාජේන්ද්‍රන්,<br>අලියාවත්ත, මොණරාගල | සිමෙන්ති මලු 9,<br>ළිං වළලු<br>3ක්,පෝච්චියක්<br>කම්බි (10mm) -4 |

| | | | |
|---|---|---|---|
| 29 | 135/බි, මදුරුකැටිය | කේ. සසිකුමාර්, මුප්පනේවත්ත, මොණරාගල | සිමෙන්ති මලු 7,ලිං වළලු 3, බිලොක් ගල් 100 |
| 30 | මදුරුකැටිය | ආර්.එම්. සිරිවර්ධන රත්නායක, අංක 42, ජයසෙන්ගම, මොණරාගල | සිමෙන්ති මලු 7 , පෝච්චි 1 |
| 31 | මදුරුකැටිය | වයි.වී.ඒ. ප්‍රදීප් අසංක කුමාර, බෝධිය පාර,, ජය ශ්‍රී ගම, මදුරුකැටිය | සිමෙන්ති මලු 7 , පෝච්චි 1 |
| 32 | මදුරුකැටිය | ආර්.එම්. සෙනෙවිරත්න, කලවැල් ආරගම, කුමුක්කන | සිමෙන්ති මලු 7 , පෝච්චි 1 |
| 33 | මදුරුකැටිය | ඩබ්.එම්. සුමනදාස, අංක 240, මදුරුකැටිය,කුමුක්කන | සිමෙන්ති මලු 7 , බිලොක් ගල් 75 |
| 34 | මදුරුකැටිය | පී. කත්රිවෙල්, මුප්පනේවත්ත, මොණරාගල | සිමෙන්ති මලු 8 , පෝච්චි 1 කම්බි (10mm) -7 |

| | | | |
|---|---|---|---|
| 35 | මාගන්දනමුල්ල | ඒ.එම්. උක්කුමැණිකා, කොලොන්ගොල්ල, මොණරාගල | සිමෙන්ති මලු 8, මැටල් කියුබ්1/4, වැලි කියුබ් 1/2, බිලොක් ගල් 100, කම්බි (10mm) - 8,ලිං වළලු 3,පෝච්චියක්,ප්ලයිවුඩ් දොර 1ක්, අඩි 6 සිට් 2ක් |
| 36 | මාගන්දනමුල්ල | රොෂාන් ප්‍රසාද් මුතුකුමාරණ | සිමෙන්ති මලු 7, ලිං වළලු 3, |
| 37 | වෙහෙරගල | පී.එච් සුනිල් දෙමටගොඩ, ගඩොල්බැද්ද, වෙහෙරගල, වැදිකුඹුර | සිමෙන්ති මලු 3, ලිං වළලු 4, වැසිකිලි පෝච්චි 01 |
| 38 | කවුඩාව | පී. ජී. ජයසිරි බණ්ඩාර, පාසල අසල, වැදිකුඹුර, මොණරාගල | සිමෙන්ති මලු 8, , ලිං වළලු 1, වැසිකිලි පෝච්චි 01 |
| 39 | 127, කොළොන්වින්න | ආර්. එම්. හීංමැණිකා, කනහිටිතැන්න, කොළොන්වින්න, ගලබැද්ද | සිමෙන්ති මලු 9 , පෝච්චි 1 කම්බි (10mm) -5 |
| 40 | 127/බි, බෝහිටිය | ප්‍රදීපා චතුරංගනී ,  අම්පිටිය, දොඹගහවෙල මොණරාගල | සිමෙන්ති මලු 9 , පෝච්චි 1 කම්බි (10mm) -5 |
| 41 | 127/බි, බෝහිටිය | කේ.ජී විමලාවතී, වෙහෙරගල හන්දිය, වැදිකුඹුර, මොණරාගල | සිමෙන්ති මලු 3 , ලිං වළලු 4, |

එම යෝජනාව සුදුසු බවට තරංග දිසානායක ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

එහිදී එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන අතුල කුමාරසිරි ගරු මන්ත්‍රීතුමන් විසින් මෙම ව්‍යාපෘතිය සිදු කිරීම සම්බන්ධව තමන් ඇතුළු තම පක්ෂය නියෝජනය කරන කණ්ඩායම විරුද්ධ නොවන බවත්,එසේ වුවද තෝරාගෙන ඇති මෙම ප්‍රතිලාභීන් සම්බන්ධයෙන් ගැටලුවක් පවතින නිසා ඊට එකඟතාවය ලබා දිය නොහැකි බවත් ප්‍රකාශ කර සිටින ලදි.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර වෙනත් විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරු සභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මොනරාගල ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයට අය වැයෙන් අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි පහසුකම් වෙනුවෙන් ද්‍රව්‍යමය ආධාර ලබා දීම සඳහා වෙන් කර ඇති රු.1,000,000.00 ක මුදලින් මොනරාගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රමවත් වැසිකිළි පහසුකම් නොමැති අඩු ආදායම්ලාභී පවුල් සඳහා වැසිකිළි ආධාර ලබා දීමට තෝරාගෙන ඇති පවුල් සඳහා මහ සභාවට ඉදිරිපත් කර ඇති මෙම තොරතුරුවලට අදාලව එම පවුල් සඳහා අදාල ද්‍රව්‍යාධාර ලබා දීම සුදුසු බවත්, ඒ සඳහා අය වැයෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන වියදම් කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවත් සභාවේ බහුතරයක් දෙනා විසින් අනුමත කර සිටින ලදී.

## 06.<u>ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම.</u>

න්‍යායපත්‍රානුකූලව පසුගිය මාසයට අදාළව ඉදිරිපත් කර ඇති ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා විසින් ගරු සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

පසුගිය මාසයේ එනම් 2021.07.01 දින සිට 2021.07.30 දින දක්වා වන ආදායම් වියදම් වාර්තාව පිළිගැනීම සුදුසු බවට කේ.එම්.ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා යෝජනා කරන ලද අතර, එම යෝජනාව සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමිය විසින් ස්ථිර කරන ලදී. සභාවේ විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුන බැවින් එම ආදායම් වියදම් වාර්තාව පිළි ගැනීම සුදුසු බවට ගරු සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

## 07. <u>කමිටු වාර්තා සලකා බැලීම</u>

නැත

## 08. <u>වෙනත් කරුණු ඉදිරිපත් කිරීම</u>

න්‍යායපත්‍රානුකූලව මීලඟට ඇත්තේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම බැවින්,වෙනත් කරුණු සම්බන්ධ සභිකවරුන්ට අදහස් ප්‍රකාශ කිරීමට ඇත්නම් ඒ වෙනුවෙන් ගරු සභාවට අවසර ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදි.

මෙහිදී වෙනත් කරුණු කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් සභාවේ සියලු දෙනාගේම එකඟතාවය මත සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**ගරු සභාපතිතුමා**

සභිකවරුන්ගේ වෙනත් කරුණු ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රිවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.4.30 ට පමණ අවසන් කරන ලදී.

2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

මෙම සභා වාර්තාව ........................................................................... වන දින පැවැති මහ සභාවේ....................................................................................................යෝජනාවෙන් සහ..........................................................................................................ස්ථිරත්වයෙන් ඒකමතිකව/ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
මොනරාගල.

1) මොනරාගල, මාගන්දනමුල්ල හි පිහිටි පරාක්‍රම මාවත ලිපිනයෙහි පදිංචි පවුල් 07 ක් පමණ භාවිතා කරන ඉතා අබලන්ව පැවති මාර්ගය ඊයේ දින ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් ගමන් කිරීමටවත් නොහැකි ලෙස දැඩි සෝදා පාළුවකට පත්ව ඇති බැවින් එම මාර්ගය කුට්ටි ගල් අතුරා ඉතා කඩිනමින් පිළිසකර කර දීම අත්‍යාවශ්‍ය බැවින්, ඒ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සනත් ගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

පවුල් 07 ක පමණ ජීවත් වන ජනතාවක් මෙම මාර්ගය භාවිත කරන බැවින් කාර්මික නිලධාරි නිලධාරි මහතා යොදවා පරීක්ෂා කර බලා කුට්ටි ගල් අතුරා භාවිතා කළ හැකි පරිදි ඉතා කඩිනමින් සකස් කර දීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

2) කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සඳහා යන වියදම සලකා බලා දැනට කිලෝ ග්‍රෑම් 01 ක විකුණුම් මිල වන රු.15.00, රු.20.00 දක්වා ඉහළ නැංවීමටත්, තව ද එක් ගොවියෙකු සඳහා නිකුත් කළ හැකි උපරිම කිලෝ ප්‍රමාණය තීරණය කිරීම සඳහාත් ගරු සභාපතිතුමා විසින් මහ සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට සන්ධ්‍යා අනුරුද්ධිකා ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම කුඹුරු ඉඩම් හිමිකරුවන්ගේ ඉල්ලීම් පරිදි ඔවුන් එම ඉඩම් සඳහා අදාළ අක්කර බදු ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ගෙවන්නේ නම් එම කුඹුරු ඉඩම් සඳහා ප්‍රාදේශීය සභාවේ ලේඛනවල සටහන් කර ඇති වරිපනම් බදු පිළිබඳ තොරතුරු සහ අදාළ බිල් කිරීම් නතර කිරීමටත්, එම දේපල සඳහා මෙතෙක් පවතින රු.407,841.68 ක අය කර ගැනීමට නොහැකි හිඟ මුදල ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතියට යටත්ව ලේඛනවලින් කපා ඉවත් කිරීම සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

➢ **ගරු සභාපතිතුමන් විසින් හදිසි යෝජනා ඉදිරිපත් කර සිටීම (රීති අංක 11 (8) )**

න්‍යායපත්‍රානුකූලව යථා පරිදී කල්දී ඇති යෝජනා සාකච්ඡා කිරීමෙන් අනතුරුව අද දින සාකච්ඡා කර අනුමැතියක් ගත යුතු හදිසි යෝජනා 01 ක් සම්බන්ධයෙන් මහ සභා අනුමැතිය ලබා ගත යුතු බවට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ අතර ඒ සඳහා මහ සභාවේ විරුද්ධත්වයක්ද නොතිබුණු බැවින් ගරු සභාපතිතුමා විසින් එම හදිසි යෝජනා පහතින් දක්වා ඇති ආකාරයට සභාගත කරන ලදී.

a) 2021 වර්ෂයට සභාව සතු සතිපොළ බදු ගත් බදුකරු විසින් ආරම්භක මාසයේ සිට ම රටේ පවතින කොරෝනා වසංගතය හේතුවෙන් සතිපොළ පැවැත්වීම අඩාල වී ඇති අතර, පළමු සතිය තුළ සතිපොළ වසා තබන ලද අතර, දෙවන සතියේ සිට නැවත පොළ විවෘත කළ ද ගොවියන් නිෂ්පාදන රැගෙන ඒම වෙළඳුන්ගේ ප්‍රමාණය සහ සමස්ථ පාරිභෝගිකයන්ගේ පැමිණීම 50%කටත් වඩා අඩු බවත්, නගරයට පැමිණීමට බොහෝ දෙනෙක් අකැමත්තක් දක්වන බැවින් ගොවීන් තම නිෂ්පාදන තම නිවෙස් වෙතින් ම තොග වෙළඳුන්ට විකිණීමේ ක්‍රමවේදයක් ද පවතින නිසා ගිවිසුම්ගත මුදලට සතිපොළ බදු අය කර ගෙන යාම ඉතාමත් අපහසු බැවින්, ගිවිසුම් ප්‍රකාරව මාසිකව සභාවට ගෙවනු ලබන වාරික මුදලින් 50% ක සහන මුදලක් අඩු කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බැවින්, මේ සඳහා මහ සභාවේ තීරණය හා අනුමැතිය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කර සිටින ලදී. එම යෝජනාව සුදුසු බවට තමෝදිරම් ජයශීලන් ගරු මන්ත්‍රීතුමා විසින් ස්ථිර කර සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධයෙන් වාද විවාද හෝ අදහස් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාවට ප්‍රකාශ කර සිටින ලදී.

ඉන් පසු මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ සාකච්ඡාවට බඳුන් වූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුණු බැවින්, ගරුසභාපතිතුමා විසින් මේ සම්බන්ධයෙන් සභාවේ තීරණය විමසා සිටින ලදී.

මෙම ඉල්ලීමේ යම් සාධාරණත්වයක් පැවතිය ද මේ මොහොතේ මෙම ඉල්ලීම සඳහා මාසික වාරිකයෙන් 50% අඩු කිරීම සම්බන්ධව තීරණයක් ලබා දිය නොහැකි බවත්, ලබන සතියේ ද සතිපොළ පැවැත්වීම හා වෙළඳුන්ගේ පාරිභෝගිකයින්ගේ පැමිණීම සම්බන්ධව සොයා බලා ආදායම් පරීක්ෂක මගින් සම්පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව ඉදිරියේදී තීරණයක් ගැනීම සුදුසු බවටත් මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී. සුදුසු බවට මහ සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**අවසන් පිටුවට**

සභිකවරුන්ගේ වෙනත් කරුණු තවදුරටත් ඉදිරිපත් නොවූ බැවින්, ගරු සභාපතිතුමා විසින් අද දින මාසික මහ සභාව සාර්ථක කර ගැනීමට පැමිණි සියලුම මන්ත්‍රීවරුන්, මන්ත්‍රීවරියන් ඇතුළුව පැමිණ සිටි සියලුම දෙනාට ස්තූතිය පුද කරමින් ගරු සභාපතිතුමා විසින් මහ සභාවේ වැඩ කටයුතු ප.ව.6.30 ට පමණ අවසන් කරන ලදී.

- 2021.08.24 දින මොනරාගල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

ආර්.එම්.රත්නවීර,
සභාපති,
ප්‍රාදේශීය සභාව,